දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2876169, 011 - 2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/1/AT/2019
ඔබේ අංකය / உமது இல. / Your No.:

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

දිනය / திகதி / Date: 2019.02. 14

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්**
**සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්**

<u>ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2019</u>

2019 වර්ෂයේ ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවිය වන **www.psc.gov.lk** හි රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ යටතේ පලකර ඇත.

02 ඒ අනුව 2019 වර්ෂයේ ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලෙසත්, වාර්ෂික ස්ථාන මාරුවීම් ලද ඔබගේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ සේවයේ නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝග පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනා කිරීමට අපේක්ෂා කරන නිලධාරීන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පලකර ඇති ස්ථාන මාරුවීම් නියෝග හා ඊට අදාළ ආවරණ ලිපිය භාවිත කර 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර පනතේ විධිවිධානවලට අනුකූලව එම අධිකාරය වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

ආර්.කේ.ආර්.ආර්. රණවීර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අභියාචනා අංශය
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවට.